*සැ. යු.* - 2023.05.04 දින පළ කරන ලද අංක 2,331 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,332 - 2023 මැයි මස 12 වැනි සිකුරාදා - 2023.05.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 626 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.* - පාර්ලිමේන්තු අයවැය කාර්යාලය පනත් කෙටුම්පත 2023 අප්‍රේල් මස 28 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 ජූනි මස 02 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 මැයි මස 19 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

625- B 82454 — 5,403 (2023/05)

# පළාත් පාලන නිවේදන

## කෑගල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(3) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1989 අංක 12 දරන (ආනුෂාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) අ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් 24(1) ආ වගන්තිය ප්‍රකාරව 2022.11.25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ ප්‍රකාශයට පත් කරන ලද පහත උපලේඛනයේ සඳහන් මාර්ග කෑගල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩී. නවෝදා ක්‍රිෂාන්ති,
ලේකම් හා බලතල, කාර්යය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.

මාර්ගයේ නම : බෙරගල යුධ හමුදා කඳවුර වැට මායිමෙන් ජඹුන්වලට යන මාර්ගය


ග්‍රාම නිලධාරි වසම : අංක 52ඒ බෙරගල ග්‍රාම නිලධාරි වසම

මාර්ගයේ දිග :

මාර්ගයේ පළල :

| | AB | BC | CD | DE | EF | FG | GH | IJ | JK | KL | LM | MN | NO | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දිග මීටර් | 13.5 | 16 | 51.5 | 6.3 | 9 | 4 | 24 | 34 | 45 | 85 | 83 | 54 | 56 | 481.3 |
| පළල මීටර් | 7.6 | 3.7 | 5.3 | 5.3 | 4.0 | 5.9 | 5.7 | 5.2 | 4.3 | 4.8 | 5.2 | 4.4 | 4.5 | |

| *මාර්ගයේ දකුණු පස* | *මාර්ගයේ වම්පස* |
|---|---|
| 1. එච්. එම්. විජේරත්න බණ්ඩාර | මුපිකෑ 3807 කැබලි අංක 7 |
| 2. අයි. ජී. ගුණසේන | |
| 3. කේ. ආර්. රණතුංග | |
| 4. ඒ. කේ. චාර්ලිස් බණ්ඩා | |
| 5. කේ. ඒ. චන්ද්‍රසේකර | |
| 6. ජී. කුසදාස | |
| 7. එච්. ආර්. සෝමාවතී | |
| 8. ජී. ජිනදාස | |
| 9. කේ. ආර්. ජයතිලක | |
| 10. කේ. ආර්. විලියම් සිඤ්ඤෝ | |
| 11. එම්. රංකිරි | |
| 12. මුපිකෑ 2660/5 | |




| | අඩි | | මීටර් | |
|---|---|---|---|---|
| | පළල | දිග | පළල | දිග |
| AB | 24 | 43 | 7.6 | 13.5 |
| BC | 12 | 52 | 3.7 | 16.0 |
| CD | 17 | 167 | 5.3 | 51.5 |
| DE | 17 | 20 | 5.3 | 6.3 |
| EF | 13 | 29 | 4.0 | 9.0 |
| FG | 19 | 13 | 5.9 | 4.0 |
| GH | 18 | 78 | 5.7 | 24.0 |
| IJ | 17 | 110 | 5.2 | 34.0 |
| JK | 14 | 146 | 4.3 | 45.0 |
| KL | 15 | 276 | 4.8 | 85.0 |
| LM | 17 | 270 | 5.2 | 83.0 |
| MN | 14 | 175 | 4.4 | 54.0 |
| NO | 14 | 182 | 4.5 | 56.0 |
| එකතුව | | 1561 | | 481.3 |

මාර්ගයේ නම : වැරැල්ලහේන මූකලාන හෙවත් උග්ගලේවත්ත මාර්ගය

ග්‍රාම නිලධාරි වසම : අංක 57 අතුරුපාන ග්‍රාම නිලධාරි වසම

මාර්ගයේ දිග : අඩි 803

මාර්ගයේ පළල : A - F - අඩි 10


F - K - අඩි 16

| *මාර්ගයේ දකුණු පස* | *මාර්ගයේ වම්පස* |
|---|---|
| යූ. ආර්. අරුණ සමන් බණ්ඩාර<br>883 පිඹුරේ කැබලි අංක 2 | යූ. ආර්. අරුණ සමන් බණ්ඩාර<br>883 පිඹුරේ කැබලි අංක 2 |
| කුසුමා කුමාරිහාමි, චන්ද්‍රා කුමාරිහාමි<br>883 පිඹුරේ කැබලි අංක 3 | 883 පිඹුරේ කැබලි අංක 7 |
| 883 පිඹුරේ කැබලි අංක 6<br>මහ ගෙදරට වෙන් කළ කොටස | කුසුමා කුමාරිහාමි, චන්ද්‍රා කුමාරිහාමි<br>883 පිඹුරේ කැබලි අංක 3 |
| කුසුමා කුමාරිහාමි, චන්ද්‍රා කුමාරිහාමි<br>883 පිඹුරේ කැබලි අංක 3 | යූ. ආර්. චානක ප්‍රසාද්<br>883 පිඹුරේ කැබලි අංක 4 |
| යූ. ආර්. චානක ප්‍රසාද්<br>883 පිඹුරේ කැබලි අංක 4 | 883 පිඹුරේ කැබලි අංක 5<br>යූ. ආර්. අරුණිකා සමන් කුමාරි |
| 883 පිඹුරේ කැබලි අංක 5<br>යූ. ආර්. අරුණිකා සමන් කුමාරි | උග්ගලවත්ත ඩබ්. ගුණතිලක |
| උග්ගලවත්ත ඩබ්. ගුණතිලක | උග්ගලවත්ත යූ. ආර්. ගුණරත්න |
| උග්ගලවත්ත යූ. ආර්. ගුණරත්න | මුපිකෑ 3240 කැබලි අංක 08 |
| මුපිකෑ 3240 කැබලි අංක 07 | මුපිකෑ 3240 කැබලි අංක 09 |
| රජයේ ඉඩම යූ. ආර්. රත්නායක බණ්ඩා | රජයේ ඉඩම යූ. ආර්. රත්නායක බණ්ඩා |
| රජයේ ඉඩම ඩබ්. විලියම් | මු. පි. 4033/3 රජයේ ඉඩම ඩබ්. පියදාස |
| කරඳගහමුල | |

බී.ආර්.එම්. කුමාරි බස්නායක (ලි.ප. අංකය 1991]223)
බ්‍රියාපදිංචි බලයලත් මිනින්දෝරු සහ,
උසාවි කොමසාරිස්,
"පසන් වරුණ"
ඇකිරියගල පාර, පරගම්මන,
කෑගල්ල.

**පිඹුරු අංකය :883**

සත්‍ය පිටපතකි
නාලන්දා ශ්‍රීයානණි,
ලේකම්.




යොමුව
වැ - වැටහිර
ලී - ලී කුඤ්ඤදය
ග - මායිම් ගල

| ලක්ෂය | පළල අඩි | දුර මීටර, අඩි | | | පර්. |
|---|---|---|---|---|---|
| | | ප්‍රමාණය | | | |
| A | 10 | AB | 10.0 | 32 | 01.18 |
| B | 10 | BC | 15.5 | 50 | 01.83 |
| C | 10 | CD | 16.0 | 52 | 01.91 |
| D | 10 | DE | 09.3 | 30 | 01.10 |
| E | 10 | EF | 23.0 | 75 | 02.75 |
| F | 10 | FG | 15.5 | 50 | 01.83 |
| G | 11 | GH | 36.0 | 117 | 04.72 |
| H | 16 | HI | 32.5 | 105 | 06.17 |
| I | 16 | IJ | 58.0 | 188 | 11.04 |
| J | 16 | JK | 32.0 | 104 | 05.73 |
| K | 16 | | | | |
| එකතුව | | | | 803 | 38.26 |

පරිමාණය : 1 : 2000

# සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ

පරණකුරු කෝරළයේ කඳු අහ පත්තුවේ
කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කෑගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ
57 අතුරුපාන ග්‍රාම සේවා වසමේ
පදගලතිරිය ගමේ පිහිටි "වැරැල්ලේපේන මූකලාන හෙවත් උග්ගලේ වත්ත " නැමැති ඉඩමට
මවිසින් සෑදූ අංක 883 පිඹුරේ කැබලි අංක 7 කොටසක්ද,
උග්ගල හෙවත් ගල්ලිඳමුල මූකලාන නමැති ඉඩමට සර්වේ ජනරාල් ගේ අංක මූපිකෑ 3240 පිඹුරේ කැබලි අංක 8 ද 4033/3 පිඹුරේ කොටසක් ද
ඒකාබද්ධ කොට
දැනට භූමියේ පිහිටි ආකාරයට මැන පෙන්වන

## පිඹුර

මායිම් - ඉහත සඳහන් පරිදි.
මා විසින් මැනීම කළේ 2020. 12 .20 දිනදීය

| | අ. | රූ. | ප. | වර්ග මීටර් |
|---|---|---|---|---|
| ප්‍රමාණය | 0 | 0 | 38.26 | 967 |

බී.ආර්.එම්.කුමාරි බස්නායක
බ්‍රියාපදිංචි බලයලත් මිනින්දෝරු සහ උසාවි කොමසාරිස්
ලි.ප.අංකය 1991 12 23

බ්‍රියාපදිංචි බලයලත් මිනින්දෝරු
2020. 12. 24

**මාතලේ මහ නගර සභාව**

ගෝ ඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය)

**විරෝධතා කැඳවීම**

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය විසින් එම නම ඉදිරියෙන් සඳහන් ස්ථානයේ මස් පිණිස එළගවයින් මරා විකිණීම සඳහා 2023 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව මාතලේ මහ නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙකුගේ විරුද්ධත්වයක් තිබේ නම් එසේ විරුද්ධ වීමට හේතු පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මගින් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බවත්, ගෝ ඝාතක ආඥාපනතේ (272 අධිකාරය) 7 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

යූ. එන්. මාදුවගේ,
නාගරික කොමසාරිස්,
මාතලේ.

2023 අප්‍රේල් මස 18 වැනි දින,
මහ නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *වෙළඳ ස්ථානය* | *වෙළඳාමේ ස්වභාවය* |
|---|---|---|
| 01. එම්. එම්. ෆාරිස් | අංක 63, මුහන්දිරම් පාර, මාතලේ | එළගව මස් |

05-124

**මාතලේ ප්‍රාදේශීය සභාව**

1893 අංක 09 දරන ගෝඝාතක ආඥාපනත යටතේ විරෝධතා කැඳවීම

මාතලේ ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ ජනවාරි මස 05 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 5.5 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. එම්. ටී. බී. හීන්කෙන්ද,
ලේකම්,
මාතලේ ප්‍රාදේශීය සභාව,
පලාපත්වල.

2023 අප්‍රේල් මස 17 වැනි දින,
මාතලේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1893 අංක 09 දරන ගෝඝාතක ආඥාපනතේ 03 වන වගන්තියේ විධිවිධාන වලින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව මාතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2023 වර්ෂය සඳහා ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා පහත උපලේඛනයේ දක්වා ඇති අය වෙනුවෙන් බලපත්‍ර ලබා දීම පිළිබඳ විරෝධතා කැඳවනු ලබන අතර, ඒ සඳහා මාතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි හා ජීවත් වන අයෙක් හෝ අයවලුන් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතුවක් පදනම් කරගෙනද යන්න පිළිබඳ විස්තර ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ ද සිට දින 14ක් ඇතුළත මාතලේ ප්‍රාදේශීය සභාව වෙත දන්වා එවිය යුතු බව ගෝඝාත ආඥාපනතේ 7(2) වගන්තිය ප්‍රකාරව මාතලේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *සත්ව ඝාතකාගාරය පවත්වාගෙන යන ස්ථානය* | *සත්ව වර්ගය* |
|---|---|---|
| එස්. එච්. මොහොමඩ්,<br>අංක 94, ජෝර්ජ් සිල්වා මාවත,<br>මහනුවර | අංක 109ජ්, හතමුනගාල, කැටවල | ගව |

05-139

**හබරාදූව ප්‍රාදේශීය සභාව**

මදුරුවන් සහ රෝගකාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා

**ප්‍රාදේශීය සභා**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ දකුණු පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කර 2013.10.25 දින අංක 1834 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV(අ) වැනි කොටසේ ඉහත සඳහන් කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා පළ කර ප්‍රකාශයට පත් කර ඇත.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (ix) වැනි උපවගන්තියේ (ච) ඡේදයෙන් මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීමට ප්‍රාදේශීය සභාවලට බලය පැවරී ඇති අතර, 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තියේ ප්‍රකාර මෙම සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගෙන වැලඳ ගැනීම සඳහා හබරාදූව ප්‍රාදේශීය සභාවේ 2023.03.14 දින මාසික මහා සභා රැස්වීමේ පාරිපාලන යෝජනා අංක 2023/56 දරන සභා සම්මුතිය අනුව තීරණය කර ඇති බවත්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවන දින සිට හබරාදූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරන බවද මෙයින් නිවේදනය කරනු ලැබේ.

දිල්ශාන් විදානගමගේ,<br>
සභාපති,<br>
හබරාදූව ප්‍රාදේශීය සභාව,

2023 මාර්තු මස 17 වැනි දින,<br>
හබරාදූව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

05-141/1

---

**හබරාදූව ප්‍රාදේශීය සභාව**

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා

**ප්‍රාදේශීය සභා**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ දකුණු පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කර 2013.10.25 දින අංක 1834 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) වැනි කොටසේ ඉහත සඳහන් කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා පළ කර ප්‍රකාශයට පත් කර ඇත.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 93 වැනි වගන්තිය සහ 126 වැනි වගන්තියේ (ix) වැනි උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේද වලින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීමට ප්‍රාදේශීය සභාවලට බලය පැවරී ඇති අතර, 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තියේ ප්‍රකාර මෙම සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගෙන වැලඳ ගැනීම සඳහා හබරාදූව ප්‍රාදේශීය සභාවේ 2023.03.14 දින මාසික මහා සභා රැස්වීමේ පාරිපාලන යෝජනා අංක 2023/55 දරන සභා සම්මුතිය අනුව තීරණය කර ඇති බවත්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවන දින සිට හබරාදූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරන බවද මෙයින් නිවේදනය කරනු ලැබේ.

දිල්ශාන් විදනගමගේ,<br>
සභාපති,<br>
හබරාදූව ප්‍රාදේශීය සභාව,

2023 මාර්තු මස 17 වැනි දින,<br>
හබරාදූව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

05-141/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.